රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකාය

# සේවා වනිතා ශාඛාව

ත්‍රෛමාසික සඟරාව

(2022 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා)

**පටුන** **පිටුඅංකය**


1. හැඳින්වීම 1-1
2. විරුලිය අත්කම් නිෂ්පාදන 1-2
3. ලෝක ළමා දින වැඩසටහන 1-3
4. හරිත රූපවාහිණී වැඩසටහන් 1-4
5. මුල්ලේරියා මානසික රෝහල් සංචාරය 1-5
6. නත්තල් දිනයට සමගාමිව පවත්වනු ලබන පොත් බෙදා දිමේ වැඩසටහන 1-6

## 1. හැඳින්වීම.

ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශුසම්පත් බලකාය ආරම්භ කර අවුරුද්දක් වැනි කෙටි කාලයක් තුළ විවිධ ව්‍යාපෘතින් රාශියක් ආරම්භ කරමින් ජාති ආගම් කුල භේද නොසලකා හරිමින් සමාජයේ සිටින දිරිය කාන්තාවන් සවිබල ගැන්වීම උදෙසා විවිධ සමාජ සත්කාර වැඩපිළිවෙලවල් රැසක් සඳහා මේ වන විට අප ශාඛාව විසින් මූලිකත්වය ගෙන කටයුතු කරයි.

රටේ පවතින පීඩිත ආර්ථිකය පිටුදකිමින් සෑම පුද්ගලයෙකුම සමාජයේ යම් තැනක ජීවත් වීමට අවැසි මූලික අඩිතාලම ඇති කර ගැනිමටත් කාන්තාවන්හට ස්වයං රැකියා අවස්ථාවන් ලබා දී තම දෙපයින් නැගී සිටීම සඳහා අත් වැලක් වීම පිණිස අප ශාඛාවේ විරුලිය අත්කම් නිර්මාණ වැනි බොහෝ ව්‍යාපෘතීන් ආරම්භ කර පුහුණු වැඩමුළු ආදිය පවත්වාගෙන යනු ලබයි. තවද අඩු ආදායම්ලාභී පවුල් වෙත නිවාස පිලිසකර කර ගැනිම සඳහා මූල්‍යමය පරිත්‍යාගයන් කිරීම සඳහා අවැසි තාක්‍ෂණික සහයන් සම්බන්ධීකරණ කටයුතු සිදු කර දෙනු ලබයි.

අප ශාඛාව යටතේ කරගෙන යනු ලබන ව්‍යාපෘතින් අතර විජලන යන්ත්‍ර ව්‍යාපෘතිය විශේෂ ස්ථානයක් හිමි කර ගෙන ඇති අතර එම විජලනය කරනු ලබන ආහාර වර්ග අපනයනය කරනු ලබයි. ඒ අතර කොහිල, කතුරුමුරුංගා, කෙසෙල් වර්ග, කොස් සහ ඖෂධ පැළෑටි ආදිය සඳහාද මේ වන විට විශාල ඉල්ලුමක් පවතී. තවද අප ශාඛාව යටතේ නිර්මාණය කරනු ලබන හස්ත කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනද විදේශ වෙළෙඳපොළ මූලික කර ගනිමින් වැඩි වශයෙන් සංචාරක කර්මාන්ත සිදු කරන්නා වූ ප්‍රදේශයන්හි අප නිෂ්පාදන බොහෝමයක් අලෙවි කරන කටයුතු සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘති වලින් ලබා ගන්නා ලද සියලුම මුදල් අප රණවිරුවන්ගේ සුභසාධනය නගා සිටු වීම සඳහා යොදා ගනු ලබයි.

## 2. විරුලිය අත්කම් නිෂ්පාදන

තල් කොළ තල කොළ ජපන් ජබර සහ පන් ආදි ප්‍රාදේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් විවිධ අත්කම් නිර්මාණ සිදු කරනු ලබයි. ඒ අනුව තල කොළ හා තල් කොළ භාවිතයෙන් ඉඳිආප්ප වට්ටි, මල් වට්ටි ආදි නිර්මාණද ජපන් ජබර භාවිතයෙන් ජපන් ජබර තොප්පි, කාන්තා අත් බෑග්, කුඩා ළමුන් සඳහා බෑග් වර්ග, වතුර බෝතල් දැමීම සඳහා සකසන ලද බහාලුම්, කසල බඳුන් යනාදි නිර්මාණ රැසක් සකස් කිරීමට අප ඒකක විසින් බොහෝ වෙහෙසක් ගෙන ඇත.

එලෙසින් ගත් වෙහෙස මත අප ශාඛාව ලද ලාභය අති විශාලය. මෙම ව්‍යාපෘතීන් සඳහා අවැසි අමුද්‍රව්‍ය සපයා ගැනීමට අප ඒකකයේ සේවය කරන සෙබල සෙබලියන් විසින් දරා ඇති වෙහෙස අප්‍රමාණය.

මෙම ව්‍යාපෘතීන් මගින් බොහෝ කාන්තාවන් හට ස්වයං රැකියාවකට අත්වැලක් වූවා නොඅනුමාණය. තවද මෙම ව්‍යාපෘතීන් බොහෝ කැමැත්තෙන් හා ආශාවකින් යුතුව සිදු කිරීමට ගත් උත්සහයේ ප්‍රතිපල අද වන විට මුදල් බවට පරිවර්තනය වී ආදායමක් බවට අප ශාඛාව වෙත ලැබී ඇත.

මීට අමතරව අප විසින් සකස් කරන ලද මෙම නිර්මාණයන් අපනයනය කිරීම මගින් විදේශ ආදායම් මාර්ගද උපයා ගැනීමට අප විසින් අදහස් කර ඇත. තවද මීට අමතරව තවත් ව්‍යාපෘතීන් රැසක් ඉදිරියේදී ස්ථාපිත කිරීමට අප විසින් බලාපොරොත්තු වන්නෙමු.









3. ලෝක ළමා දින වැඩසටහන

2022 ඔක්තෝම්බර් මස 01 වන දිනට යෙදී තිබුනු ලෝක ළමා දිනයට සමගාමීව අනුල විජයරාම ළමා නිවාසය අම්බලන්ගොඩහිදි සේවා වනිතා ශාඛාවෙහි ප්‍රධානත්වයෙන් ශ්‍රමදානයක් පැවැත්වූ අතර එහිදි එම ළමා නිවාසය සතු වූ අක්කර 02ක් පමණ වූ ඉඩම බෝග වගාව සඳහා සුද්ධ පවිත්‍ර කර දිම සිදු විය.

එම ළමා නිවාසය සතු වූ ඉඩම බෝග වැවීම සහ වගාවන් ආරම්භ කිරීමට සුදුසු පරිදි භූමිය සකස් කල අතර එහි වගා කිරීමට සුදුසු බීජ වර්ග ලබා දීමද මෙහිදි සිදු විය.






මෙම සත් ක්‍රියාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශුසම්පත් බලකා රෙජිමේන්තුවෙහි මධ්‍යස්ථාන සේනාවිධායකතුමන් ඇතුලු බොහෝ පිරිසකගේ දායකත්වයෙන් යුතුව සිදු කරන ලද අතර එම ළමා නිවාසයේ සිටින දැරියන් වෙනුවෙන් ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍යමය පරිත්‍යාගයක් සිදු කරන ලදි.



4. හරිත රූපවාහිනී වැඩසටහන්

හුණුපිටිය ගංගාරාම පරිශ්‍රයේ ඇති හරිත රූපවාහිනී සංස්ථාවෙහි පැවැත්වූ "ජීවිතාර්ථ" රූපවාහිනී වැඩසටහන සඳහා අප ගරු සභාපතිතුමිය සේවා වනිතා සම්බන්ධීකරණ නිලධාරිනී සහ අප සේවා වනිතා ශාඛාවේ ප්‍රධාන ව්‍යවසායිකාවක් වන ජනාධිපති සම්මාන ලාභී ආර්පී කුසුමාවතී මහත්මිය සහභාගී විය.

මේ සඳහා අප සේවා වනිතා ශාඛාව මගින් නිෂ්පාදනය කරනු ලබන අත්කම් නිර්මාණ පිළිබඳ සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් මගින් අප රටේ සිටින දිරිය කාන්තාවන්ගේ බලගැන්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. ඒ තුළින් අපගේ නිෂ්පාදන කෙරෙහි මහජනයා තුළ රුචිකත්වයක් හා ආශාවක් ඇති කරලීමට මෙය මහගු අවස්ථාවක් විය.

මෙම රූපවාහිනී වැඩසටහනෙන් අනතුරුව ප්‍රේක්ෂක ජනතාව අපගේ ව්‍යාපෘති බෙහෙවින් අගය කල අතර අප හා එක් වී තවත් ව්‍යාපෘති ගොන්නක් සිදු කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලදි.





05. මුල්ලේරියා මානසික රෝහල් සංචාරය

ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ සේවා වනිතා ශාඛාවේ සභාපතිතුමිය සහ සාමාජිකයින් මුල්ලේරියාව ජාතික රෝහලේ මානසික සෞඛ්‍යහි රෝගින් බැලිම පිණිස ඔක්තෝම්බර් මස 23 වන දින එම ස්ථානයට යන ලදි.

ගරු මන්ත්‍රිතුමාගේ මගපෙන්වීම යටතේ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමිය ශාන්ති අබේසේකර මහත්මිය සහ කෘෂිකර්ම බලකා සේවා වනිතා ශාඛාවේ සියලුම සාමාජිකයින් 2022 ඔක්තෝම්බර් 23 වන දින මුල්ලේරියා ජාතික රෝහලේ අංක 05(කාන්තා) වාට්ටුවේ නේවාසික රැදවියන්ගේ සුවදුක් විමසීම සඳහා පැමිණයහ.

සේවා වනිතා සාමාජිකයින් විසින් කැලිප්සො සංගීත කණ්ඩායම විසින් සපයන ලද ආකර්ශණීය සංගීතයක් පිරිනැමූ අතර, ඒ අතරතුර ශ්‍රිලයුකෘපබ සේවා වනිතා ශාඛාවේ සාමාජිකයින්ද රැදවියන් සමග සුහදව කාලය ගත කළහ.

වැඩි සැලකිල්ලක් සහ සැලකිල්ලක් අවශ්‍ය වූ රෝගින් 40ක් සිටියහ. ඔහුන්ගේ මානසික සහ කායික ස්ථිරභාවය ඉහළ නැංවීමේ අරමුණින් සෞඛ්‍ය සම්පන්න සහ රසවත් දිවා ආහාරයක් හා ඔහුන්ගේ අවශ්‍යතා සඳහා සීලිං පංකා, සනිපාරක්‍ෂක හා දෛනික අවශ්‍යතා බෙදා දීම සිදු විය.

සේවා වනිතා කෘෂිකාර්මික බලකායේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මිය සහ සේවා වනිතා සාමාජිකයින් රැදවියන් සඳහා ආහාර බෙදාදීමට මෙය අවස්ථාවක් කර ගන්නා ලදි.

මෙම අවස්ථාව අවසානයේදි ජනාධිපතිතුමා විසින් සේවා වනිතා ශාඛාවේ සියලුම සාමාජිකයින්ගේ වටිනා දායකත්වයට හා සහභාගිත්වය වෙනුවෙන් ස්තුතිය පුද කර සිටින ලදි.









6. නත්තල් දිනයට සමගාමීව පවත්වනු ලබන පොත් බෙදා දීමේ වැඩසටහන

2022 වර්ෂයේ 25 වන දිනට යෙදී තිබෙන නත්තල නිමිති කර ගනිමින් ශ්‍රී ලංකා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේවා වනිතා ශාඛාව විසින් ඒකකයන්හි රාජකාරි කරනු ලබන සෙබල/සෙබලියන්ගේ මල් කැකුළු වැනි පුංචි දූ/පුතුන්ගේ දක්ෂතා ඔප් නංවනු පිණිස පැවැත්වූ මෙම චිත්‍ර තරගාවලිය කිසිදු වයස් භේදයකින් හෝ තරාතිරමක් නොතකා සියලුම නිලයින්ගේ දූ දරුවන් එක සේ සලකා පැවැත්විය.








